# උත්ථාන සමයේ දෙවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 6 : 1–7

**ඔව්හු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ සත් දෙනෙකු තෝරා ගත්හ.**

ඒ දවස්වලදී ගෝලයන්ගේ ගණන වැඩි වන කල, හේබ්‍රෙව් බස කතා කරන ජුදෙව්වරුන්ට විරුද්ධව ග්‍රීක බස කතා කරන ජුදෙව්වරු පැමිණිල්ලක් ඉදිරිපත් කළහ. දිනපතා සහනාධාර දීමේ දී තමන්ගේ වැන්දඹුවන් නොසලකා හරිනු ලබති”යි ඔව්හු කීහ. එවිට දොළොස් දෙනා ගෝල සමූහයා රැස් කරවා,
“අප දෙවි දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර කටයුතුවල යෙදී සිටීම කිසිසේත් සුදුසු නැත. එබැවින් සහෝදරයෙනි, මේ තනතුරට පත් කරන පිණිස යහපත් යයි පිළිගත් එසේම ශුද්ධාත්මයෙන් ද ප්‍රඥාවෙන් ද පූර්ණ සත් දෙනෙකු ඔබ අතරෙන් තෝරා ගන්න. ඉන්පසු අපි යාච්ඤාවෙහි ද ධර්ම දේශනාවෙහි ද නියුක්තව සිටිමු” යි කීහ. මේ යෝජනාව ගැන මුළු මහත් පිරිස සතුටු වූහ. එවිට ඔව්හු ඇදහිල්ලෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ මිනිසෙකු වන ස්තේපන් ද ඔහු සමග පිලිප් ද ප්‍රොකොරස් ද නිකනෝර් ද තිමොන් ද පර්මෙනස් ද ජුදෙව් ආගමට හැරුණු අන්තියෝකියේ නිකොලොස් ද තෝරා ගත්හ. ඔව්හු මේ අය අපෝස්තුළුවරුන් වෙත ඉදිරිපත් කළහ. අපෝස්තුළුවරු යාච්ඤා කොට ඔවුන් මත අත් තැබූහ. තවද දෙවියන් වහන්සේගේ වචනය පැතිර ගියේය. ජෙරුසලමේ ගෝලයන්ගේ ගණන බොහෝ සේ වැඩි විය. පූජකයන්ගෙන් මහත් සමූහයක් ද ඇදහිල්ල පිළිගත්හ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 33: 1-2, 4-5, 18-19

පිළිතුර: සමිඳුනි ඔබේ කරුණාව අප කෙරෙහි වේවා. ආලේලූයා //

ගීය:

දමිටුනි, හිමිතුමන් කෙරේ ප්‍රීති සන්තෝෂ වන්න.
ප්‍රශංසාව අවංක අයට හොබනා දෙයකි.
වීණාව වයා හිමිතුමන් පසසන්න. තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසැසුම් ගිත ගයන්න.

සමිඳුන්ගේ වචනය අවංක ය. එතුමන්ගේ ක්‍රියා සියල්ලක්ම විශ්වාසශීලීය.
දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය. මහ පොළොව හිමිතුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

දේව භය ඇත්තෙනි, කරුණාව පතන්න. මරණයෙන් ගළවන පිණිස ද දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබූ බැවින්
දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිඳින
ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6 : 16–21

**ඔව්හු උන් වහන්සේ මුහුද මත ඇවිදිනු දුටහ.**

සවස් වූ කල, උන් වහන්සේගේ ශ්‍රාවකයෝ මුහුදට ගොස් ඔරුවට නැඟී මුහුදෙන් එතෙර කපර්ණාවුමට යන්නට පිටත් වූහ. රෑ බෝ වී තිබුණ නමුත්, ජේසුස් වහන්සේ ඒ තාක් ඔවුන් වෙත නොපැමිණි සේක. තද සුළඟක් හැමූ බැවින් මුහුද කැළඹිණි. ඔව්හු කිලෝ මීටර් පහක් පමණ ඔරුව පැදගෙන ගිය කල ජේසුස් වහන්සේ මුහුද මත ඇවිදිමින් ඔරුව ළඟට වඩින බව දැක බියපත් වූහ. එහෙත් උන් වහන්සේ ඔවුන් අමතා, "මේ මම ය, බිය නොවන්නැ"යි වදාළ සේක. ඔව්හු උන් වහන්සේ ඔරුවට පිළිගන්නට සතුටු වූහ. එකෙණෙහිම ඔරුව ඔවුන් යමින් සිටි රටට පැමිණියේය.

සුවිශේෂ වාක්‍යය එසේය.